
**7 ශ්‍රේණිය - විද්‍යාව**

**07. ශක්ති ආකාර හා භාවිත**

***නිවාඩු කාලීන ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකා අංක 01 ඃ***

01- ඔබේ ගෙවත්තේ කුඩා බෑවුමක් සහිත ස්ථානයක් තෝරා ගන්න. හිස් ටින් 2ක් සොයා ගන්න. එක් ටින් එකක් රූපයේ පරිදි බෑවුම පහලින් තබා අනෙක් ටින් එක පහල ටින් එකේ වදින සේ බෑවුමේ ඉහළ සිට පෙරලන්න. පරීක්ෂණය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i- ඉහත පරීක්ෂණයේ දී ඔබට දැකිය හැකි නිරීක්ෂණ සියල්ල ලියන්න.

ii- ඔබ දන්නා ශක්ති ආකාර 5 ක් ලියන්න.

iii- බෑවුම ඉහල ඇති ටින් එකෙහි ගබඩා වී ඇති ශක්ති ආකාරය ලියන්න.

iv- ටින් එක පහළට පෙරළී යන විට එහි ඇති ශක්ති ආකාරය කුමක්ද?

v- ටින් දෙක එකිනෙක ගැටීමේදී ඇතිවූ ශක්තිය කුමක්ද?

02- පහත දැක්වෙන එක් එක් අවස්ථාව හා බැඳි ශක්ති ආකාරය සුදුසු පරිදි යාකරන්න.

| | |
|---|---|
| i- ගෙඩියක් ගසකින් ගිලිහී වැටීම | විභව ශක්තිය |
| ii- ඉටිපන්දමක් දැල්වීම | ධ්වනි ශක්තිය |
| iii- කැටපෝලයකින් ගලක් විදීම | ආලෝක ශක්තිය |
| iv- සීනුවක් නාද වීම | තාප ශක්තිය |
| v- ගසක අත්තක ගෙඩියක් නිසලව තිබීම | චාලක ශක්තිය |
| vi- විදුලි කේතලයෙන් ජලය රත්කිරීම | |

03- නිවසේ එදිනෙදා කටයුතු වලට උපයෝගී කරගන්නා උපකරණ කීපයක් පහත දැක්වේ. ඒ පිළිබඳ විමසා බලා පහත වගුව සම්පූර්ණ කරන්න.

| **ලබා දෙන ශක්තිය** | **උපකරණය** | **පිටවන ශක්තිය** |
|---|---|---|
| විද්‍යුත් ශක්තිය | විදුලි ස්ත්‍රික්කය | තාප ශක්තිය |
| ------------------------ | ගුවන් විදුලිය | |
| ------------------------ | විදුලි පංකාව | |
| | බල්බය | |
| | රූපවාහිනිය | |
| | බ්ලෙන්ඩරය | |


04- ශක්ති පරිණාමණය යනු කුමක්ද

-----------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------

05- පහත රූප සටහන් වල දැක්වෙන්න එක් එක් අවස්ථාවන් හඳුනා ගෙන එහිදී සිදුවන ශක්ති පරිණාමනය ලියන්න.

a 

c 

b 

d 

බලංගොඩ අධ්‍යාපන කලාපය වෙනුවෙන්

සම්පත් කරුණාරත්න, ර/බල/රජවක විද්‍යාලය